මැනික්දිවලගේ ශෂිකා ගෙව්වන්දි රන්බන්ඩා
කලමනාකරණ හා මූලය පීඨය
රුහුණ විශ්වවිද්‍යාලය

MF/2016/4612

කෙටි කතාව

වැඩිමල් සිතක ලැගුම් ගත්තෙමි

(රුහුණ විශ්වවිද්‍යාලයේ සිදුවූ සත්‍ය සිදුවීමක් පාදක කොටගෙන ලියන ලද්දකි)

ඒ රුහුණ විශ්වවිද්‍යාලයේ සුසන්ත නේවාසිකාගාරය ඉදිරිපිටයි...

ගිනි හිරු මධ්‍යගතව රැස් විහිදුවමින් සිටී.
දා බිඳු එකින් එක ගලා අවුත් ලා නිල් පැහැ කමිසය තෙත් කර ඇත. එය දැන් තද නිලට හුරුය. ඊටත් වඩා ඇය මගහැරෙතැයි බියෙන් වඩයක් සමඟ ප්ලේන්ටියක් පමණක් බී ලහි ලහියේ පුරවාගෙන පැමිණි කුස පොඩිය නැවතත් යමක් ඉල්ලනු දැනේ.
එහෙත් දැන් ඊට වේලාව නොවේ.
අද දිනය තීරණාත්මකය.
අද විශ්වවිද්‍යාල භූමිය තුල ඇය දකින්නට ලැබෙනා අවසාන දවසයි.
පපුවට ඉඳී කටු තුඩකින් අනින තරමේ වේදනාවක් දැනේ.

ඒ සියල්ල පරයා සිදුවනු ඇතැයි මා බලාපොරොත්තුවෙන් සිටිනා ඇගේ පැමිණීම උක්ත සියල්ලෙහිම අඳෝනා නිම කර දමන බව මා දන්නේ අත්දැකීමෙනි....
හිරු රැස්වල විඩාවත් කුසගින්නත් මා හිඳ සිටි ගල් පතුරේ උනුසුමත් සියල්ල ඇය ඉදිරිපිට මට ශූන්‍යක්ම විය.
ඒ ඇයම බැවිනි...

අප හඳුනාගෙන වසරක් පමණ වුවද, අප එකම විශ්ව විද්‍යාලයක සිටියද අප මුන ගැසී ඇත්තේ හරියටම පස් වරක් පමනි.
එය හුදෙක් වැරදීමක් හෝ අතිශ්‍යෝක්තියක් නොව දහ දොලොස් වර සිහි ඇතිව කරන ලද අතීතාවර්ජනවලින් පසු අතිශය සිහි බුද්ධියෙන් උපුටා ගන්නා ලද ගනනය කිරීමක ඉවසිලිමත් ප්‍රතිපලයකි...
ඔව් මා නැවත තහවුරු කරමි....

අවුරුද්දකටම මා ඇය මුනගැසී ඇත්තේ පස් වරක් පමනි.

මීට වසරකට පමණ පෙර මා ඇය දුටුවේ මුහුනු පොතෙනි. ඇය සුදුම නැත නිලුපුල් ඇස්ද නැත වල ගැසුනු කම්මුල්ද නැත

එහෙත් මූසිකයට බරදා ගොස් නැවත බලන්නට හිතෙන තරමට ඇ හැඩය. හුරුබුහුටි ය. "Studies Management & Finance at #University_of_Ruhuna" යන්නම පමණක් මට ඇ වෙත මිත්‍ර ඇරයුමක් යැවීමට ප්‍රමාණවත් විය. මා තව දුර සොයන්නට නොවෙහෙසුනෙමි.

කෙල්ලන්ට හුරු සාමාන්‍ය ආඩම්බරකම ප්‍රකට කරමින් තවත් දින දෙක තුනක් පමණ කල් ගෙන ඇ මගේ මිත්‍ර ඇරයුම පිලිගෙන තිබුනි.

ඉදින් මදක් කල් ගිය පසු ඇ හා ඇරඹුනු පිලිසඳර ඇය මට වඩා වසර තුනකින් වැඩිමහල්

එකියක බව මට දැන්වීය.

ඉදුරාම කිවහොත් එවකට මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨයේ කනිශ්ඨයකුව සිටි මා හට ඈ කළමනාකරණ හා මූල්‍ය පීඨයේ අති ජේශ්ඨ උත්තමාවියක් විය. විශ්වවිද්‍යාල භාශාවෙන් ඇය මගේ සුපර් සින්නියකි.

කෙමෙන් අප අප පිලිබඳ තොරතුරු හුවමාරු කරගත් අතර ඇගේ යහපත පිණිස මා ඒවා මෙහි සඳහන් නොකරන්නෙමි.

මුලදී අපතර තිබූ බොහෝ පරතරයන් කෙමින් වියැකුනේ කාලයත් සමඟය. කල් යත්ම අප අතර ජේශ්ඨත්වයට එහා ගිය ආදරණීය බැඳීමක් ලියලා තිබුනි.

ඉතිං ඒ සීමාන්තික ජේශ්ඨත්වය අසීමාන්තික ප්‍රේමයකට නැගුනු යුරු සිහි කිරීම අදටත් ඉතා මිහිරිය.

ආදරය අන්ධ යයි මම නොකියමි...
ආදරය අන්ධ නොවනවා සේම සියල්ල දැක දැකත් නිහඬවම සිටියි.
ඒ මා දන්නා ආදරයයි.
ඉදින් ඇය ජේශ්ඨ මානවිකාවක බැව් දැන දැනම මා ඇයට හදවතින්ම බැඳුනෙමි...

මුලදී අක්කා නමින් වූ ආමන්ත්‍රණය කෙටි කලකින්ම වියැකී ඔයා මෙයා වන්නට වැඩි කලක් ගත නොවිනි.
ඇගේ එදිනෙදා සියලු කටයුතු මා සමඟ පැවසීම මට සතුටක් මෙන්ම සියුම් ආඩම්බරයක්ද විය. කෙමෙන් එම දැනුම් දීම් මාගෙන් කරනා අවසර ගැනීම් බවට පත් වන විටා මා ඇගේ ජීවිතය තුල කෙතරම් වැදගත් අයෙකු දැයි මට දැනෙන්නට විය.
ඇයට අවශ්‍ය වූයේ මා තුල පාලනය වීමටයි. ඇගේ නිදහස මා හට පැවරීමටයි.

ඒ තුල ඇය පිලිබඳ විශාල අයිතියක් මට දැනුනි. පොඩි දරුවකුට තමන් කාලයක සිට පෙරුම් පිරූ තමන් කැමතිම වර්ගයේ පොතක් ලැබූ කල දැනෙන සතුට මෙන් එකල මා හට ඇති වූ හැඟීම් නැවුමු ය.

සෑම පිටුවකම සුවඳ වර්ණ විශාල ආශ්වාදයකි. සෑම පිටුවක්ම අලුත්ම බලාපොරොත්තුවකි...

ඇද මට කියවන්නට කියවන්නට තවත් එහිම කිමිද සිටින්නට ආස හිතෙන තරමේ රසවත් පොතක් විය.
තිබූයේ එකම වෙනසකි.
කුඩා කල ඉක්මනින් පොත කියවා අවසාන කිරීම මාගේ ආශාව උවත් මෙකල එය නිම වනවාට අකමැති තරමේ ලෝබකමක් මසිත පුරා පැතිර තිබින. හැකි නම් ජීවිත කාලය පුරා වුවද කිය වීමට තරම් මා ඊට බැඳි සිටියෙමි...

අපි ජීවිතය බෙදාගත්තෙමු. පුංචි භාවියගේ පණ්ඩිත කතා අහන් ඉන්නට ලැබීම ජීවිතයේ දැනුන තෘප්තිකරම හැඟීම් අතරින් එකකි. ලඟින් නොසිටියත් එවකට ආදරබර වචනවල අඩුවක් තිබූ බවක් මට මතක නැත.

වචනයට හැරවෙන්නට බොහෝ කලකට පෙර සිට මා ඇයට පෙම් කලෙමි. ප්‍රශ්නය වූයේ එකල තිබූ මානසිකත්වය අනුව එය කුමක්දැයි හඳුනා ගැනීමට මා හට කල් ගත වී තිබීම පමණි.
මා නවකයකු සමයේ විශ්වවිද්‍යාල සංස්කෘතිය ඉගෙනගන්නා විට එනම් තෙල බෙදූ කාලයේ විශ්වවිද්‍යාලය තුල දැකිය හැකි කොකු හඳුනාගත්තෙමි. එනම් ආදර

සම්බන්දකම් ය.. එහිදී ජේශ්ඨ මානවිකාවක සමඟ ජුන්නෙකු ගසන කොක්ක ලැම්බට් කොක්ක විය. එදින එය මා සිනහවෙමින් සටහන් කරගත්තෙමි.
ඒ මතකය අදටත් මා මදක් ලොමු දැහැ ගන්වයි...
ඒ එදා මා සිනහ වූයේ මටම බැව් සපත වූ බව දැනුනා නිසා විය යුතුය.
ජීවිතය යම් සන්ධිස්ථානයක මා නවතා අමුතුම සෙල්ලමක් කර ඇති සෙයකි.

කාලය බොහෝ වෙනස් වී ඇත. අද මා ලැබ්බට් කොක්කක හිමිකරුවෙකි. නමුත් බොහෝ විට ලැම්බට් කොක්කක් මහ සමාජය තුල වුවද පිළිගැනීමට පත් නොවුනු නිසා එය සඟවාගෙන සිටින්නට මා තීරනය කරන්නට ඇත.

ඒ හුදෙක්ම ඇගේ යහපත පිණිසය.

හැම විටම සින්නියක ලං කරගත් පොර මානසිකත්වයෙන් පෙනී සිටීමට වඩා මට අවශ්‍ය වූයේ ඇගේ ගෞරවය ආරක්ශා කිරීමටයි. බොහෝ විට විශ්වවිද්‍යාලය භූමිය පුරා විසිර සිටි පෙම්වතුන් දැක දැකත් ඇය මා පෙනෙන මානයේ සිටියදීම නොදන්නා වුන් මෙන් හිතට බර දී දරාගත් හැම මොහොතකම හදවත පුරා තිබූයේ අන් කිසිවක් නොව ඈ කෙරෙහි තිබූ අප්‍රමාන ආදරය සහ ගෞරවයම පමනි.

ඉතිං
පිරිමි හදවතකට දැරීමට අපහසු බොහෝ දෑ මා ඈ වෙනුවෙන් දරාගත්තෙමි.
පුරා වසරක් පුරාවට ඇය පෙනි පෙනී දුරින් සිට ඇයට පණ මෙන් ආදරය කලෙමි....

එදා සිට අද දක්වා ඈත සිට ඈ දෙස බලා සිටි කාලය ලංව සිටි දින පහට වඩා හොඳටම වැඩිය.

අප මුලින්ම හමුවූ දිනය මට අදටත් සිහි කල හැක. ඒ ජුන්නන්ගේ සෝශල් දිනයයි. එදින මා සිටියේ සිහියකින් නොවේ. නැටුම් තෙල් මා පදමට සිහි මද කර තිබිනි.
මා ඔහේ වැනෙමින් බරාදය දිගේ ගමන් කලෙමි.

මා ඉදිරියට එක වරම පැමිනියේ ඇයයි.
මා වික්ශිප්ත වූයෙමි. එය කිසිවිට බලාපොරොත්තු වූ හමුවීමක් නොවීය.
"දැන් සැපද?"
බෝල ඇස් ලොකු කර යටි තොලට හැඩ දී ඇය විමසීය.
මාගෙ වෙරි මත සිඳීමට දෙහි ඉස්ම හුමි තෙල් හෝ ඩෙක්රොස් අවශ්‍ය නොවීය.
චූටි අත් දෙක බැඳගෙන මූන ආයාසයකින් නපුරට හදාගෙන සිටි ඇයම ප්‍රමානවත් විය.

රුපියල් තුන්සිය අනූවක් අපතේය. ඒ මට කාලම හිඳුනු බැවිනි.
මම ගල් ගැසී සිටියෙමි.

පලමුව හමුව එසේය.

පලමු හමුවීමම මා බේබද්දකු මෙන් ඈ ඉදිරියේ සිටීම ඈ මවක මෙන් දරාගත්තාය. බොහෝ ගැහැනුන් තනි කර යන්නට හේතු හොයනා විට ඇය තනි කර යන්නට අමු අමුවේ හේතු තිබියදී මා ලඟ ඉන්නට හේතු ගෙතුවාය....

ඇය ශරීර ප්‍රමානයෙන් කුඩා වුවත් සමහර අවස්තාවලදී මා පාලනය කරගත්තේ දරුවන් හත අටකගේ මවක සතු ඉවසීමෙනි. බොලඳකමට එහා ගිය දයාර්දත්වයක් එහි තිබිනි.

බොහෝ විට මට ඇය විශ්වවිද්‍යාල භූමියේදි මුන නොගැසෙයි. එවිට මා කරනුයේ ඇය

සිටි සුසන්ත නේවාසිකාගාරය අසල ගල් පතුර ලඟට ගොස් ඇය දෙස බලාගෙන පැය ගනන් ඇය සමඟ දුරකතනයෙන් කතා කිරීමයි...
ඇය තෙවන මහලේ සිට මා දෙස බලමින් පුංචි දරුවකු මෙන් හුරතල් වූ ඒ අතීතය සුන්දරය. ඒ සුන්දරත්වය නොඉදුල් මලක මෙන් මම රැක්කෙමි.
දුර සිට වින්දෙමි....

වසර තුනක පරතරයක් අපතර වූවද ඇගේ හැසිරීම තවත් වසර තුනකට බාල අයෙකුගේ මිස වැඩි අයකුගේ ලෙස නම් නොවීය. ඇයට බෝනික්කන් රැසකි. ඇගේ ප්‍රියතමයා මාශිය. ඇය මෙන්ම මාශීද හුරතල් විය. එමෙන්ම මාශී මට වඩා බෙහෙවින් පිංවන්ත විය. මට වඩා අතිශය වැඩි කාලයක් මාශී ඇය තුරුලේ හිඳ ඇත. මුවට සිනහ නැගුනද මාශී මට වඩා පිං කර තිබුනු බැව් මට හැම විටම හැඟුනි.

ඉතිං ඒ හුරතල් කෙලි පොඩිත්ත හමුවූ ඇතැම් දිනෙක පුංචි විහිලුවක් කර ඇය තරහ ගන්වන්නට මා අතිශයින්ම ප්‍රිය කලෙමි.
ඒ අන් කිසිවක් නිසා නොව බොරු තරහක් ගෙන මගේ පිටට නෝක්කාඩුවට ගසන ඇගේ ස්වල්ප ස්පර්ශයකට පවා මා බෙහෙවින් ආදරය කල බැවිනි.

ඒ බොරු කේන්තියට මා කවදත් ප්‍රිය කලෙමි.
රවන්නට නොතේරුනත් පුංචි තොල් නොපිට පෙරලා කරන රැවිල්ල හුරතල් ය. ආදරණීයයය...

ආත්මීයව ලං වූ හිතක් ලඟ නන්නාදුනන්නන් සේ හැසිරීමට වීම යම් විටෙක පෙර කල පවක් වන්නට ඇත. අපි දෙදෙනාම එය ගෙවූයෙමු.

නමුත් කල් යත්ම මෙසේ ලොවට සඟවමින් මා ඇයට කරනුයේ වරදක් යයි මට සිතුනි.
මෙහි අවසානයක් තිබිය යුතුය. මම හිතට අවධාරණය කලෙමි.
ඉතින් එතකින් මා ඇය පිලිබඳව තීරණයකට එලඹුනෙමි.
.
.
.
නෑ ඒ ඔබ සිතන තීරණය නොව අනෙකකි.

මා මාගේ දෙමාපියන්ට ඇය පිලිබඳ සියල්ල පැවසුවේ ඇය මට විශ්වවිද්‍යාලය හමාර කරන විට මග දමා යා හැකි තරමේ අල්ප මාත්‍ර අයකු නොවූ නිසාය.
ලැම්බට් යයි ලසු කොට අතැර දා යා නොහැකි නිසාය.
මා සමඟම ජීවිත කාලය පුරාම සුරැකිය යුතුවූ වස්තුවක් වූ නිසාය.
කොටින්ම ලැම්බට් නෙහ් බං යැයි කවුරුන් සිනහ උවත් ඇය මට තාවකාලික ආතල් එකක් නොවූ නිසාය.

ප්‍රශ්න පැන නැගුනේ එතැන් සිටයි. අවුරුදු තුනක වැඩිමහලු බව සියලු දෙනාටම ප්‍රශ්නයක් වූයේ සිතුවාටත් වඩා තීව්‍රවය.
එතකින් නොනැවතුනු මම ඔවුන් කැමති කරගැනීමට දිගු කලක් පුරාවට නොගත් උත්සාහයක් මට සිහි කල නොහැක. නමුත් ඒ හැම විටම ප්‍රශ්නය කෙලවර වූයේ ඔවුන් වැඩිමහලු අයකු කරකාර ගැනීමේ පල විපාක අටුවා ටීකා ටිප්පනි සමඟ මා ඉදිරියේ දිග හල අතිශය දීර්ඝ පවුලේ සාකච්චා වටවලින් සාකච්ඡාව අවසන් වීමෙන් පසුවය.

පවුලේ එකම පිරිමි දරුවා මම වීමද මීට බෙහෙවින් බලපෑය.

එකල පවුලේ අතිශය සුලබ මාතෘකාව එය විය.
මට නිවස එපා වන තරමට එය උඩු දුවන්නට වීය.

පවුල හා ඇය අතර ඉතා අසීරු තෝරාගැනීමක් දක්වා ප්රශ්නය උඩු දුවා තිබුනි.
හැම විටම එය නැවත නැවතත් විවිධාකාරයෙන් මා වෙත පැමිනීය.
අවසානයේ මට වැටහුනු එකම දෙය නම් මෙය තව දුරටත් කරගෙන යාම පල රහිත බවයි.
ඇය කෙල්ලකි. ඇයට ගෞරවයක් ඇත. එක්වීමට නොහැකි නම් මා තව දුරටත් ඇය මා සන්තකයේ තබාගෙන ඇයට බලාපොරොත්තු දෙමින් කරනුයේ අගතියකි. අනෙක් අතට ඇයට මට වඩා හැම අතින්ම හොඳ අයෙකු ලබා ගත හැකියි.

ඇරත් මාගෙ මව මා වෙනුවෙන් බොහෝ දුක් විඳ ඇත. ඇයට දුකක් දීමද කල නොහැක්කකි.
ඇය කියනා අන්දමට ඇගෙන් කිසි දිනෙක මීට අනුමැතිය නොලැබෙනු ඇති.

තවද මා උපාධිය හමාර කරනා විට තවත් කාලය ගතව තිබෙනු ඇති. එවිට ඇයට තවත් කාලයක් තීරණයක් නැතුවම මා වෙනුවෙන් සිටීමට පැවසීම යුක්ති සහගත නොවේ.

ඉදින් මෙවන් තත්වයක් යටතේ තව දුරටත් ඇය මා වෙනුවෙන් තබා ගන්නේ නම් සැබැවින්ම මා ඇයට ආදරය කරනවා වන්නට පුලුවනිද...

එවර මසිත විමසීය.

ඉදින්....

"මේක නවත්තමු.... තවත් මේක කරල වැඩක් නෑ...."
හිතට දිරි ගෙන මං අසිහියෙන් මෙන් කියා දැමුවෙමි.
පපුව කීරි ගැහෙද්දී කියා දැමුවෙමි.

එදින තරම් ඇය හැඬු දිනයක් මට තවමත් සිහි කල නොහැක. ඇය ඉකි ගහමින් හැඩ වූයේ මගේම දුර දිග නොබලා ගත් තීරණ බැව් මට අමතක කල නොහැක.
පුංචි ඇස් රතු වන තුරු පුංචි දරුවකු මෙන් ඇය හැඬුවාය.
පිරිමි අඬන්නෑ අඬවනව විතරයි ඇය සිතන්නට ඇත.
"නැහැ මැණික උඹට වඩා මං අඬනව අද මගෙ හිතින්...."
මම එදින ඒ වේදනාව වචන නොකලෙමි.

අදටත් ඒ මොහොතෙහි මට දැනුන වේදනාව ඇය නොදන්නවාට සැක නැත.
එලෙස ඇයට සැඟවූ දුක් ගොඩක් මේ පපුව යට එදා මෙන්ම අදත් ඇත.

නමුත් ඇගේම යහපත උදෙසා මා දරාගත්තෙමි.
මම මිතුරන් සේ හිඳිමු යැයි මුග්ධ යෝජනාවක් ඇයට කලෙමි.

ආදරය කරන්නට යෝජන කල මම මිතුරන් මෙන් සිටිමුයි කියන විටදීත් ඇය මට අවනත වූවාය. ඇය කිසිවිට මට එදිරිව නොගියාය.

ඇය එදා ඊට කැමති වන්නට ඇත්තේ කෙසේ හෝ මා ඇය ළඟ සිටින නිසා විය යුතුය.
ඒ අතරතුර කාලයේදීත් කවුරුන් හෝ ඇගෙන් මනාපය විමසූ විටදීත් පෙර පරිදිම ඒ සියල්ල පැමින, මා අධිකරණයේ තබා දුරකථන සංවාද සහිතවම මට එවා එකින් එක කියනා ඇගේ පුරුදු එලෙසම පැවතින.

මා හැර ගොස් ඇයට ගැලපෙන ඇගේම වයසේ කළමනාකරණ උපාධියක් හිමි කොල්ලකු සොයාගැනීම ඇයට අපහසුවක් නොවිනි.

නමුත් ඇය දමා යන්නට තතනන මා ලඟම ඇය රැඳෙන්නට වෙර දැරීමම මගේ පිරිමි පපුවට දුන් වේදනාව වචනයට කැටි කල නොහැක.
වේදනාව සඟවාගෙන සමාජ සම්මතයට ඉඩ දී අප අපි කලක් යහලුවන් මෙන් ඇසුරු කලෙමු.
නමුත්
යහලුකම ආදරයෙන් අවසන් විය හැකි මුත් ආදරය කිසිදා යහලුකමින් නිම නොවන බව ජීවිතය පලමු වරට මට පහදා දුනි.
නැවතත් වතුර යට ගැසූ රබර් බෝලයක් මෙන් ආදරය උඩ මතු වන්නට එතරම් කල් ගත නොවීන.
ඉතින් අපි නැවතත් වෙන දෙයක් වෙන්නට හැර දුර සිටම ආදරය කලෙමු.

ලං වන්නටත් බැරි වෙන් වන්නටත් බැරි බැඳීම්වල වේදනාව ඔබ යම් දිනෙක අත්විඳිනු ඇතී. එතෙක් ඊට ටිප්පනි සපයමින් ගොඩ සිට පිහිනීමට මා ඔබ යොමු නොකරමි.

ඉතින් මා නැවතත් මතකයන් මතින් වර්තමානයට පැමිණියෙමි.

මා දෙනෙතට ආ කඳුලු බිඳු ඉක්මනින් පිසදා ගත්තේ වටපිට කවුරුන් හෝ බලා සිට ඇත්දැයි බලමිනි.

නැත...
ඇය එනතුරු මා පමණි.....

මා මදක් නැගිට අතීතාවර්ජනයෙන් පන ලද්දකු මෙන් ලොකු හුස්මක් ගෙන පියවර කිහිපයක් සුසන්තෙන් ඉවතට ගියෙමි.

ඇය විශ්වවිද්‍යාලය තුල සිටිනා අවසානම දිනය අදයි.
අද ඔවුන්ගේ අවසාන සාදයයි. ඉතින් අද මා ඇය විශ්වවිද්‍යාලය තුල දකින අන්තිමම අන්තිම දිනයයි....
ඉතින් මෙපමන කල් පපුව තුල දරා සිටි කඳුලු ඇස්වලින් පිට වීම අසාධාරණ නොවන්නේය.

තවත් මොහොතකින් ඈ පැමිණියාය.
ඇය තද තැඹිලි පැහැ සාරියකින් සැරසී දෙවුලියක මෙන් සැරසී මා අබියස සිටී.
ඇය සමඟ අහම්බෙන් දිනෙක ලඟ ලඟින් මහ වැස්සේ එකම කුඩය යට ගෑවී නොගෑවී ගිය දිනට පසු මා ඈ ලස්සනටම දුටු දිනය අදයි....

එදාද අප එකට යනු දුටු බොහෝ වුන් අපට විහිලු කල යුරු මට තවමත් මතකය.
එදා පපුවට දැනුන අසරණකමද අද මෙන්මය....

ඇය තවම මා දැක්කේ නැත. නමුත් වටපිට බලමින් ඇය සොයන්නේ මා බැව් මට රහසක් නොවේ.
ඇය ඇමතුමක් ගනී.
ඒ මා හට විය යුතුය.
මම ඉක්මනින් කලිසම් සාක්කුවට අත දමා මගේ දුරකථනය ගත්තෙමි.

අවාසනාවකි.

එය අක්‍රීය වී ගොස් ඇත. ඇය බැලීමට කඩිමුඩියේ පැමිනි මට දුරකථනය ආරෝපණය කිරීමට අමතකව ඇත.

ඇය සිටියේ මිතුරන් රැසක් පිරිවරාය.
මා එතැනට යෑම ඇයට අපහසුතාවයක් වනු ඇතැයි මා මටම කීවෙමි.
ඒ පෙර දිනෙක අප මුහුන පෑ සිදුවීම්වලදී ඈ මුහුන පෑ අසරනක බව මතක හෙයිනි.
අනෙක් අතට ඈ විශ්වවිද්යාලය තුල රැඳී සිටිනා අවසාන දවසේ යම් හිත් රිදීමක් ඇති
උවහොත් එය සදාකාලික වනු ඇතී.
මා එතැනින් මදක් ඉවත් උනෙමි.

ඇය මා බොහෝකොට සෙව්වාය.
ඇගේ සතුට වෙනුවෙන් මා වහන් ඌයෙමි.

යටි තොල සපාගෙන චූටි ඇස් පොඩි කරන් ඇය වටපිට සිසාරාම මා සොයන බැව් දැක
දැකත් මා වෙනදා මෙන්ම දුරින් හිඳ ඇය අවසාන වරටත් බැලුවෙමි.

නමුත් එතරම් වේලා ඈ වෙනුවෙන් බලා සිටි මා ඈ හමුවට නොයාමට වග
බලාගත්තෙමි....

මා උඹ බලන්නට අවසාන මොහොතේවත් පැමිණ නැතයි නුඹ සිතන්නට ඇත....

මා සිතෙහි උඹ පිලිබඳව අල්පමාත්ර හෝ හැඟීමක් නැතයිද නුඹ සිතනවා ඇත.

බෝල් ඇස්වල කඳුලු මං ඇයි මේ තරම්ම මේ නපුරු මිනිහාට ආදරේ කරන්නේයි
නුඹෙන්ම අසනවා ඇති...

නුඹ හරිම අසරණ වෙන්නැති...

ඒත්.....
.
.
.
නෑ මැණික.....

"ඔබ මලකට කැමති නම් ඔබ ඒ මල කඩාගනීවි...
ඒත් ඔබ ඒ මලට ආදරේ නම් ඔබ හැමදාම ඒ මල බලාගනීවි. අතට ගන්න උත්සහ
නොකරම"
කියන දේ...
මම හැමදාමත් විශ්වාස කරනවා.

..............................නිමි................................

මං කතාව ලිව්ව මට පුලුවන් උපරිමයෙන්....

ඒත් මම ලියපු අනිත් කතාවල වගේ රෝමාන්තික තැන් කිහිපයකුත් තවරන්න අවශ්ය
නිසාම මං මේ කතා නායකයගෙන් ඇහුවා....
.
.
.
"එතකොට අයියෙ තව රොමැන්ටික් තැන් මොනවද කතාවෙ ලියන්න පුලුවන් ඔයාල අත්
අල්ලන් ගිය එක්කො පපුවට තුරුල් උන මොනාහරි...."

ඔහු මදක් සිනාසුනි.

"නංගි...
අද වෙනකන් මං එයාගෙන් අතකින්වත් අල්ලල නෑ..
එයා මගෙ පපුව ලඟට උස...
(ඔහු මතක් කර මදක් සිනා සෙයි)
.
.
ඉස්සි ඉස්සි මං දිහා බලද්දි පපුවට තුරුල් කරගන්න හිතුන දවස් තිබ්බ...
ඒත්........."
ඔහු නිහඬයි...

"ඒත් එයාට හරි නැති හිංද පාඩුවෙ හිටියා...?"
මං ඉතිරිය සම්පූර්ණ කලා.

"ම්ම්ම්ම් ඔව්...."
ඔහු හිනා වෙයි.

ඉතිං...

ප්‍රේමය නම්
රාගයෙන් තොර
සඳ එළිය සේ අචින්ත්‍යයි....

ඉතිං එවන් ප්‍රේමයක් මිහිමත පැවතිය නොහැකි යයි ඔබ යම් විටක සිතනු ඇත.

ප්‍රේමය ඔබට එකකි මට තවකකි.
ප්‍රේමය ඇත්තේ අසීමාන්තිකව පුද දීමට මිස තේරුම් ගැනීමට නොවේ යයි
මම ඔබට කියමි...

..............................................................

කතෘගෙන් වදනක්...

රුහුණෙ අහස යට මේ වගේ තව ආදරණීය වගේම දුක්බර ආදර කතා ගොඩක් රුහුණු අහස බලන් ඉන්නැති...
සමනල පාලමෙන් පටන්ගත්තු ඒ ආදර කතා සුසන්තෙටම වෙනුරටම පිය සටහන් ඉතිරි කරන්නැති...
ඈය නැතුව යන මාවතේ අදටත් පුරුද්දට වගේ සුසන්තෙ දිහාවට ඇස් යනකොට පපුවට දැනෙන වේදනාව කියාගන්න හෝඩියෙ අකුරු මදි ඇති...
දාහක් දෙනා අතර සිටියත් අදටත් දැනෙන තනිකම පාලුව පිරුන හදවත කියනව ඇත්තෙ එකම දෙයයි....

"නොපෙන්නුවට ගොඩක් ආදරේ කලා මං..."

ඉතිං....

ඈයද, විශ්වවිද්‍යාලයීය ශිශ්‍යයින්ද මෙය මුහුනු පොත තුල කියවනු ඇත.
ඉතින්...

ඔහු ඈයට කෙතරම් ආදරය කලාදැයි ඈය මෙන්ම, ලැම්බට් කොක්ක යනු තව දුරටත් ආතල් කොක්කක් නොවන බව ඔවුනුත් වෙන වෙනම වටහාගනු ඇත....